# රුධිර සංසරණය

හෘදයේ කොටස් හඳුනාගන්න.




1. සංස්ථානික මහා ධමනිය ආරම්භවන ස්ථානය නිවැරදිව දැක්වෙන වරණය මින් කුමක් ද?
    a. හෘදයේ දකුණු කෝෂිකාවෙන් ආරම්භ වේ.
    b. හෘදයේ වම් කෝෂිකාවෙන් ආරම්භ වේ.
    c. හෘදයේ දකුණු කර්ණිකාවෙන් ආරම්භ වේ.
    d. හෘදයේ වම් කර්ණිකාවෙන් ආරම්භ වේ.
2. හෘදයෙන් පොම්ප කරන ඔක්සිජනීකෘත රුධිරය, අක්මාව දක්වා ගමන් ගන්නා මාර්ගය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
    a. සංස්ථානික මහා ධමනිය, යාකෘතික ධමනිය, අක්මාව
    b. සංස්ථානික මහා ධමනිය, යාකෘතික ශිරාව, අක්මාව
    c. පුප්ඵුශීය ධමනිය, යාකෘතික ධමනිය, අක්මාව
    d. පුප්ඵුශීය ධමනිය, යාකෘතික ශිරාව, අක්මාව

LIVEWORKSHEETS

3. මානව දේහයේ ඔක්සිජනීකෘත රුධිරය පරිවහනය කරන රුධිර නාලයක් වන්නේ පහත ඒවා අතුරින් කුමක් ද?

   a. පුප්ඵුශීය මහා ධමනිය
   b. සංස්ථානික මහා ධමනිය
   c. උත්තර මහා ශිරාව
   d. අධර මහා ශිරාව

4. මානව දේහයේ ඔක්සිජනීකෘත රුධිරය පරිවහනය කරන රුධිර නාල පමණක් අඩංගු වරණය මින් කුමක් ද?

   a. උත්තර මහා ශිරාව හා අධර මහා ශිරාව
   b. දකුණු පුප්ඵුශීය ධමනිය හා වම් පුප්ඵුශීය ධමනිය
   c. යාකෘතික ශිරාව හා යාකෘතික ප්‍රතිහාර ශිරාව
   d. පුප්ඵුශීය ශිරාව හා යාකෘතික ධමනිය

5. මිනිස් දේහයේ එක් අවයවයක සිට සෘජුවම තවත් අවයවයක් කරා ඔක්සිජනීහෘත රුධිරය පරිවහනය කරන රුධිර නාළය මින් කවරක් ද?

   a. යාකෘතික ශිරාව
   b. යාකෘතික ධමනිය
   c. යාකෘතික ප්‍රතිහාර ශිරාව
   d. වෘක්කීය ශිරාව

6. දේහයේ අධර කොටසේ ඇති ඔක්සිජනීහෘත රුධිරය, හෘදයට ගෙන එන ප්‍රධානතම රුධිර නාලය වනුයේ මින් කුමක් ද?

   a. සංස්ථානික මහා ධමනිය
   b. පුප්ඵුශීය ධමනිය
   c. අධර මහා ශිරාව

LIVEWORKSHEETS

d. උත්තර මහා ශිරාව

7. ශරීරය පුරා රුධිරය ගමන් කරවීමට අවශ්‍ය බලය යොදනු ලබන්නේ පහත සඳහන් කුමන අවයවය මගින් ද?

a. අක්මාව

b. හෘදය

c. මහා ප්‍රාචීරය

d. පෙනහලු

8. හෘදයේ ද්විතුණ්ඩ කපාටය පිහිටා ඇත්තේ ?

a. දකුණු කර්ණිකාව හා දකුණු කෝෂිකාව අතරය.

b. වම් කර්ණිකාව හා වම් කෝෂිකාව අතරය.

c. දකුණු කර්ණිකාව හා වම් කෝෂිකාව අතරය.

d. දකුණු කෝෂිකාව හා වම් කෝෂිකාව අතරය.

9. මිනිසාගේ හෘදය සම්බන්ධ ප්‍රකාශ 3ක් පහත දැක්වේ .

A - හෘදයේ කුටීර 04 කි.

B - කර්ණිකා බිත්ති කෝෂිකා බිත්තිවලට වඩා ඝනනමින් වැඩිය.

C - ප්‍රධාන ධමනි ආරම්භ වන තැන්වල අඩසඳ කපාට පිහිටා ඇත.

මෙම ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ ?

a. B හා C පමණි.

b. A , B ,C පමණි.

c. A හා C පමණි.

d. A හා B පමණි.

LIVEWORKSHEETS

10. ඔක්සිජන් සාන්ද්‍රණය අඩුම වනුයේ පහත සඳහන් කවර වාහිනියේ ද ?

a. පුප්ඵුශීය ධමනිය


b. පුප්ඵුශීය ශිරාව

c. සංස්ථානිකක මහා ධමනිය

d. අධර මහා ශිරාව

## ද්විත්ව රුධිර සංසරණය

රූපයේ දැක්වෙන්නේ ද්විත්ව රුධිර සංසරණය දැක්වෙන අවස්ථාවකි. එහි අවයව හා රුධිර නාල හඳුනාගන්න.



✳ දේහය හරහා එක් වරක් රුධිරය ගමන් කරන විට හෘදය හරහා දෙවරක් රුධිරය ගමන් කිරීම ........................................... ලෙස හැඳින්වේ.

LIVEWORKSHEETS